විදිහට ජීවත් වෙලා "මං පවුලට පළමු තැන දුන්නා" කියනවා. එතැන වෙලා තියෙන්නෙ මුදලාලිගෙ ආර්ථික ශක්තියට යටත් වීම. ඒක ප්‍රේමය විදිහට අර්ථ දක්වන්න බැහැ. ඊට පස්සෙ මුදලාලිගෙ තින්කින් එක නිළියගෙ කටින් පත්තර පිටු පුරා එළියට එනවා. ඊට පස්සෙ නිළිය නැති වෙනවා. කිවිඳිය නැති වෙනවා. ක්‍රීඩිකාව නැති වෙනවා. ලේඛිකාව නැති වෙනවා. නර්තන ශිල්පිනිය නැති වෙනවා. ඉගෙන ගන්න කෙල්ල නැති වෙනවා. විලාසිතා නැති වෙනවා. ස්වාධීන චින්තනය නැති වෙනවා. කටහඬ බිරිඳගෙ වුණාට ඒක පිටිපස්සෙ ඉන්නෙ බලයෙන් ඇයව යටත් කර ගන්න කෙනා. ඒ කිසිවක් ප්‍රේමය ලෙස අර්ථ දක්වන්න බැහැ. ප්‍රේමයේදී කිසිවෙකුට කිසිවෙකු නැති වෙන්න බැහැ. ප්‍රේමයේදී සිද්ධ වෙන්න ඕන දෙදෙනා ඉතිරි වීම සහ දෙදෙනාට ම තවත් දේ එකතු වීම.

## 04. ප්‍රේමයේදී ලිංගිකත්වයට මුල් තැන දීම පිළිබඳ ඔබේ අදහස ?

ඒ ප්‍රශ්නෙම තියෙනවා අපේ වාගේ ගෝත්‍රවාදී රටක් ලිංගිකත්වයට මොන තරම් බයයි ද කියන කුහක අදහස. ලිංගිකත්වය කියලා කියන්නෙ ස්ත්‍රියක් සහ පිරිමියෙක් අබිරමණය කිරීම ම නෙමෙයි. දැකීම, ස්පර්ශ කිරීම, කතා කිරීම, සිතිවිලි බෙදා ගැනීම, ආශා කිරීම යනාදී සියල්ල ලිංගිකත්වයේ කොටස්. ලංකාව සලකන්නෙ හරියට ප්‍රේමය සම්බුද්ධ නම් ලිංගිකත්වය දේවදත්ත වගේ. ප්‍රේමය සක්‍රයා නම් ලිංගිකත්වය යක්ෂයා වගේ. එතන ම තමයි ප්‍රශ්නෙ තියෙන්නෙ. ලෝකෙ කොහෙද ලිංගිකත්වයෙන් තොර ව ප්‍රේමයක් තියෙන්නෙ? නමයෙ පන්තියෙ ප්‍රජනනය පාඩම හරියට ඉගැන්නුවා නම් ලංකාවෙ කෙල්ලන්ටවත් කොල්ලන්ටවත් ඔය වින්නැහිය වෙන්නෙ නෑ. ප්‍රේමය විෂයයක්. ලිංගිකත්වය සංස්කෘතියක්. අපේ වැඩිහිටියො අපිට ඉගැන්නුවෙ ආනන්දයෙන් ප්‍රඥාවට යන්න කියලා. එහෙම නැතුව ප්‍රඥාව



අත්පත් කරගන්න බෑ කියලා. ඒක හරියට මුලින් ප්‍රේම කරන්න බැන්දට පස්සෙ සෙක්ස් කරන්න වගේ අදහසක්. ඒ කියන්නෙ පළමුව ප්‍රේමය, දෙවනුව ලිංගිකත්වය. ආනන්දයේ සිට ප්‍රඥාවට යනවා වගේ ප්‍රේමයේ සිට ලිංගිකත්වයට යනවා. මේක සම්පූර්ණ බොරුවක්. සම්පූර්ණ මිථ්‍යාවක්. ප්‍රඥාවෙන් යමක් අත්පත් කරගෙන ආනන්දය ලබන්න පුළුවන්. මං හිතන්නෙ ප්‍රඥාව නැති ගොඩක් අයට ආනන්දය නෑ කියලා. ඒ වගේ ප්‍රේමයෙන් ලිංගිකත්වයට යන්න පුළුවන් නම් ලිංගිකත්වයෙන් ප්‍රේමයට එන්නත් පුළුවන්. ලිංගිකත්වය කියන්නෙ යකෙක් නෙමෙයි.

